සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 - 2023
## Third Term Test - Grade 06 - 2023

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

**කාලය මිනි. 40 යි**

උපදෙස් :
- තෝරාගත් එක් ක්ෂේත්‍රයකට අදාළව ඇති ක්‍රියාකාරකමක නිරත වන්න.
- සෑම ක්ෂේත්‍රයකට ම අදාළව ඇති ක්‍රියාකාරකමක් සඳහා නිර්ණායක පහක් ඇති අතර එක් නිර්ණායකයකට ලකුණු 5 බැගින් මුළු ලකුණු 25 ක් හිමිවේ. අවසානයේ එම ලකුණු 100 ට පරිවර්තනය කර ලකුණු ලබා දෙනු ලැබේ.

**ප්‍රායෝගික ක්‍රියාකාරකම අංක**
01 - කෘෂිකර්මය
02 - ආහාර
03 - ආරම්භක තාක්ෂණය
04 - ව්‍යාපාර කටයුතු
05 - රූපණ

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 - 2023
## Third Term Test - Grade 06 - 2023

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 01 – කෘෂිකර්මය

අවශ්‍ය ද්‍රව්‍යය

පාසලේ ඇති බඳුන්වල රෝපණය කර ඇති එකම ආකාරයේ නොවන විසිතුරු ශාක බඳුන් කිහිපයක්

ගුරු උපදෙස්

- පාසල් පරිශ්‍රයේ ඇති විවිධ විසිතුරු ශාක බඳුන් කිහිපයක් සපයා ගැනීම.
- පංති කාමරයේ මුල්ලක් හෝ ස්ථාන කිහිපයක් නම් කරන්න.
- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.

  (තෝරාගත් පංති කාමර ස්ථාන සංඛ්‍යාවට අනුව)
- එක් එක් කණ්ඩායමට සමාන අයුරින් විසිතුරු පැළ බඳුන් බෙදා දෙන්න.

සිසු උපදෙස්

- ගුරු භවතා විසින් ලබාදුන් විසිතුරු බඳුන් සහිත ශාක උපයෝගි කර ගනිමින් දර්ශනීය මුල්ලක් හෝ ස්ථානයක් සැකසීම සිදුකරන්න.

ලකුණු ලබාදීමේ ක්‍රමවේදය

- නිවැරදි ලෙස විසිතුරු ශාක බඳුන් තෝරාගැනීම (ලකුණු 05)
- ස්ථානයේ දර්ශනීය බව (ලකුණු 05)
- කණ්ඩායම් ක්‍රියාකාරීත්වය (ලකුණු 05)
- කාල කළමනාකරණය (ලකුණු 05)
- නැවත කාර්ය පරිශ්‍රය සැකසීම (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 06 - 2023**
**Third Term Test - Grade 06 - 2023**

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

**කාලය මිනි. 40 යි**

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 02 - ආහාර

- මුළුතැන්ගෙයි පවතින ඉඩකඩ අනුව කාර්යය ඒකක ස්ථානගත කිරීම.

**අවශ්‍ය ද්‍රව්‍යය**

1. මුළුතැන්ගෙවල් වල පිංතූර හා නම් ලියූ කාඩ්පත්

   I හැඩය, L හැඩය, U හැඩය

2. කාර්ය ඒකක නම් කළ බෝඩ්

   1. පිසීම 2. පිළියෙල කිරීම 3. සේදීම

   4. ගබඩා කිරීම 5. පිළිගැන්වීම

**ගුරු උපදෙස්**

1. විවිධ හැඩයේ මුළුතැන්ගෙවල් වල නියැදි හෝ පිංතූර කාර්යය පරිශ්‍රයේ තබන්න.
2. මුළුතැන්ගෙයි කාර්ය ඒකකවල නම් ලියූ බෝඩ් කට්ටල හා හැඩවල නම් ලියූ (I, L, U) කාඩ් කට්ටල 2 පමණ ලියා කලවම් කර තබන්න.
3. සිසුන් වරකට දෙදෙනා බැගින් දී ඇති නියැදි නිරීක්ෂණය කර කාඩ් නිවැරදිව නියැදි ඉදිරියේ තැබීමට උපදෙස් දීම.
4. මෙසේ මුළුතැන්ගෙවල් සැලසුම් කිරීමට හේතු වාචිකව අසා ලකුණු ලබා දෙන්න.

   A. I හැඩය සුදුසු කිනම් ඉඩකටද?

   B. L හැඩය සුදුසු කිනම් ඉඩකටද?

   C. U හැඩය සුදුසු කිනම් ඉඩකටද?

**නිර්ණායක**

- නිවැරදි ඒකක තේරීම (ලකුණු 05)
- නිවැරදි හැඩය තේරීම (ලකුණු 05)
- වාචික ප්‍රශ්න (ලකුණු 3 × 5 = 15)

මුළු ලකුණු 25

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 06 - 2023
Third Term Test - Grade 06 - 2023

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 03 – ආරම්භක තාක්‍ෂණය

බිත්ති සැරසිල්ලක් සැකසීම

**අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ**

- දිග 20 cm පළල 15 cm ප්‍රමාණයේ කාඩ්බෝඩ් කැබැල්ලක්
- වර්ණ කඩදාසි (පාට කීපයකින්)
- ගම්
- කතුරු
- පන්චරය (ගුරුභවතාට)
- රැඳවීමට නූලක්

**ගුරු උපදෙස්**


- නියමිත දිනට අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන ඒම සඳහා දරුවන්ට උපදෙස් ලබාදීම.
- ක්‍රියාකාරකමේ යෙදීමට දරුවන්ට අවශ්‍ය සහය ලබාදීම.
- නිර්ණායක අනුව ලකුණු පිරිනැමීම.

**සිසු උපදෙස්**

- නියමිත දිග පළල සහිත කාඩ්බෝඩ් කැබැල්ල මත පාට A4 හෝ වර්ණ කඩදාසි අලවන්න.
- 2 cm පළල රාමුවක් A4 හෝ වර්ණ කඩදාසි මගින් අලවා ගන්න.
- මල්, සමනලුන් වැනි ද්‍රව්‍ය භාවිතයෙන් අලංකාර කර ගන්න. (කඩදාසි මගින් සගසාගත්)

**නිර්ණායක**

1. අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ සපයා ගැනීම (ලකුණු 05)
2. 2 cm ක් පළල රාමුව සැකසීම (ලකුණු 05)
3. අලංකාර කිරීම සඳහා මල් වැනි දෑ සැකසීම (ලකුණු 05)
4. බිත්ති සැරසිල්ල අලංකාර ලෙස සැකසීම (ලකුණු 05)
5. නියමිත කාලයට නිම කිරීම, නිමාව, වැඩ ස්ථානීය පිරිසිදුකම (ලකුණු 05)



සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 - 2023
## Third Term Test - Grade 06 - 2023

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 04 – ව්‍යාපාර කටයුතු

**ක්‍රියාකාරකම**

ඔබ කැමති ද්‍රව්‍ය භාවිතා කරමින් ප්‍රයෝජනවත් නිර්මාණයක් කරන්න.

**ගුරු උපදෙස්**

1. සිසුන්ට කළ හැකි නිර්මාණ පිළිබඳව දැනුවත් කරන්න.
2. නිර්මාණයක ප්‍රයෝජනවත් බව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
3. නිර්මාණයක් කිරීම සඳහා භාවිතයට ගත හැකි සම්පත් (ද්‍රව්‍ය) පිළිබඳව සිසුන් දැනුවත් කරන්න. ඒවා සිසුන්ට ම සපයා ගැනීමට සිදුවන බව ද දැනුවත් කරන්න.
4. ඇගයීම් නිර්ණායක පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
5. නිර්මාණය කිරීම සඳහා සිසුන්ට ලබා දෙන කාලය පිළිබඳව ඇනුවත් කරන්න.
6. නිර්මාණය කිරීම සඳහා සිසුන්ට අවශ්‍ය වන ද්‍රව්‍යවල මූලික සූදානම (කැපීම් කෙටීම්) සිදු කර ගෙන එන ලෙස සිසුන්ට දැනුම් දෙන්න.

**ඇගයීම් නිර්ණායක**

| | | |
|---|---|---|
| 1. | පෙර සූදානම | (ලකුණු 05) |
| 2. | ප්‍රයෝජනවත් බව | (ලකුණු 05) |
| 3. | නිර්මාණශීලී බව | (ලකුණු 05) |
| 4. | නියමිත කාලය තුළ කාර්ය නිම කිරීම | (ලකුණු 05) |
| 5. | කාර්ය පරිශ්‍රය පිරිසිදු කිරීම | (ලකුණු 05) |
| | | (මුළු ලකුණු 25) |

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 06 - 2023
Third Term Test - Grade 06 - 2023

# ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 05 – රූපණ

**කඩදාසි කැටයම් සුභ පැතුම් පතක් නිර්මාණය**

**අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ**


- A4 පාට දෙකකින් කඩදාසි (තද පාට - 1, ලා පාට - 1)
- පේපර් කටර් එකක්
- ගම්
- කතුරු


**ගුරුවරයාට උපදෙස්**


- නියමිත දිනට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ රැගෙන ඒමට දරුවන් දැනුවත් කිරීම.
- ක්‍රියාකාරකම සඳහා දරුවන්ට අවශ්‍ය සහය ලබාදීම.
- නිර්ණායක අනුව ලකුණු ලබාදීම.

**සිසුන් සඳහා උපදෙස්**

- අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ සපයා ගන්න.
- ලා පැහැ A4 කොළය දෙකට නවා භාගයක් කපා වෙන්කර ගන්න.
- කපා ඉවත් කිරීමට හැකි ආකාරයේ නිර්මාණය ඇඳ ගන්න. (A රූපය බලන්න)
- කපා ඉවත් කරන කොටස් අඳුරු කරන්න (B රූපය බලන්න)
- ඒවා කපා ඉවත් කරන්න.
- තද පැහැ A4 කොළය දෙකට නවා නිර්මාණය සහිත A4 කොළය එක් කොටසක අලවා ගන්න.
- තද පැහැති A4 කොළය මත ලා පැහැති A4 කොළය අලවන්න.


A


B



සකස් කරන ලද
සුභ පැතුම් පත

**ලකුණු දීමේ නිර්ණායක**

1. අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ සපයා ගන්න (ලකුණු 05)
2. සුදුසු නිර්මාණයක් ඇඳ ගැනීම (ලකුණු 05)
3. කපා ඉවත් කළ යුතු කොටස් කපා ඉවත් කිරීම (ලකුණු 05)
4. සුභ පැතුම් පත නිර්මාණය (ලකුණු 05)
5. නිමාව වැඩ ස්ථානය පිරිසිදු කිරීම (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06, 07, 08, 09 ශ්‍රේණි - 2023
## Third Term Test - Grade 06, 07, 08, 09 - 2023

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

### පොදු උපදෙස් - ගුරුවරුන් සඳහා

01. දී ඇති ක්‍රියාකාරකම් අතුරින් එකක් පමණක් ශිෂ්‍යයා කළ යුතුය.
02. එම තෝරා ගැනීම කුසපත් ඇදීමෙන් හෝ වෙනත් සුදුසු ක්‍රමයකට සිදුකළ හැකිය.
03. ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය කල්තබා සූදානම් කරගන්න.
04. එක් එක් තේමාවට අදාළ ගුරුභවතුන් ඊට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම ඇගයීමේ මූලිකත්වය ගැනීම වඩා සුදුසු වේ.
05. සිසු උපදෙස් (කාර්ය පත්‍රිකාව) කළු ලෑල්ලේ ලියා හෝ කඩදාසියක ලියා හෝ සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
06. කාලය විනාඩි 40 කි. එක් ක්‍රියාකරකමක් සඳහා මුළු ලකුණු 25 කි. අවසානයේ එය ලකුණු 100ට පරිවර්තනය කර ලකුණු ලබා දෙන්න.
07. ක්‍රියාකාරකම් සිදු කරන අතර සහ ලිඛිත පිළිතුරු අනුව (අදාළ අවස්ථා වලදී පහත දැක්වෙන ආකෘතිය අනුව සිසුන්ට ලකුණු පිරිනමන්න. (අවශ්‍ය නම් වාචික කරුණු විමසන්න.)
08. සෑම ක්‍රියාකාරකමක් සඳහාම නිර්ණායක 05 කි. එක් නිර්ණායකයක් සඳහා ලකුණු 05 කි. එය පහත ආකාරයට ලබා දෙන්න.

    05 - විශිෂ්ටයි
    04 - ඉතා හොඳයි
    03 - හොඳයි
    02 - සාමාන්‍යයි
    01 - සංවර්ධනය විය යුතුයි

| ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ නම | නිර්ණායක | | | | | මුළු ලකුණු (25න්) | මුළු ලකුණු (100න්) |
|---|---|---|---|---|---|---|---|
| | 1 (ලකුණු 5) | 2 (ලකුණු 5) | 3 (ලකුණු 5) | 4 (ලකුණු 5) | 5 (ලකුණු 5) | | |
| (1) ........................................ | .............. | .............. | .............. | .............. | .............. | .................. | .................. |
| (2) ........................................ | .............. | .............. | .............. | .............. | .............. | .................. | .................. |
| (3) ........................................ | .............. | .............. | .............. | .............. | .............. | .................. | .................. |
| (4) ........................................ | .............. | .............. | .............. | .............. | .............. | .................. | .................. |

නිරීක්ෂක මණ්ඩලය

| නම | අත්සන |
|---|---|
| 01. ........................................................ | .............................. |
| 02. ........................................................ | .............................. |
| 03. ........................................................ | .............................. |